# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2320/06 - 2023 පෙබරවාරි මස 20 වැනි සඳුදා - 2023.02.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකු නිවේදන

**15 වන ආකෘතිය (20 වන රීතිය)**

අධිකරණ අධීක්ෂණයට යටත්ව ගණන් බේරා වසා දැමීමේ නියෝගය.

කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණයේ දී ය.

(වාණිජ අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන)

කොළඹ 02, යූනියන් පෙදෙස, අංක 277 දරන ස්ථානයෙහි ලියාපදිංචි කාර්යාලය පිහිටි ද ස්ටැන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ් සමාගම පිළිබඳ කාරණාවයි.

සහ

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 32 සහ 37 (6) වගන්ති යටතේ සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ XII වන කොටස යටතේ අධිකරණ අධීක්ෂණයට යටත්ව ද ස්ටැන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ් යන සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා වූ ඉල්ලීමකි.

| | |
|---|---|
| නඩු අංකය | : CHC 34/2020/CO |
| ස්වභාවය | : ගණන් බේරා වසා දැමීම |
| කාර්යපටිපාටිය | : ලඝු |
| වටිනාකම | : - |

ජයකොඩි ආරච්චිගේ දොන් සමන් ජයනාත් නානායක්කාර,
අධ්‍යක්ෂ,
බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ 01.

පෙත්සම්කරු



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

පෙත්සම හා අනෙකුත් කරුණු සලකා බැලීමෙන් අනතුරුව කොළඹ වාණිජ මහාධිකරණය විසින් 2023.02.08 වැනි දින ද ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ් සමාගම අධිකරණ අධීක්ෂණයට යටත්ව ගණන් බේරා වසා දැමීමට නියම කරන ලදී; තවද ඈවරකරු වශයෙන් කොළඹ 04, කාසල් පටුමග, අංක 11, 03 වන මහල, එස් ජේ එම් එස් ඇසෝසියේට්ස්/බාරේ යන ලිපිනය දරන ජෙරාඩ් ජීවානන්තන් ඩේවිඩ් මහතා පත් කිරීමට අධිකරණය නියෝග කරන ලදී. එකී සමාගම ඈවර කිරීමේ කාර්යය සඳහා ඈවරකරු වශයෙන් පත් කරන ලද ජෙරාඩ් ජීවානන්තන් ඩේවිඩ් මහතා විසින් 2023.03.21 දින සහ ඉන් පසුව සෑම තුන් මාසයක් පාසාම මෙම සමාගම ගණන් බේරා වසා දැමීම සම්බන්ධ තත්වය හා ප්‍රගතිය පෙන්නුම් කරන්නාවූ සහ එකී වත්කම් මුදල් කිරීම හෝ සමාගම ගණන් බේරා වසා දැමීම හා සම්බන්ධිත වෙනත් යම් කරුණක් සම්බන්ධයෙන් කලින් කලට අධිකරණය මගින් නියෝග කරන යම් කාරණයක් සම්බන්ධව වුවද ලිඛිත වාර්තාවක් කොළඹ වාණිජ මහාධිකරණයේ ලේකම් වෙත ඉදිරිපත් කරන ලෙස අධිකරණය විසින් නියෝග කරන ලදී. තවද, බිල්පත් ගාස්තු අය කිරීම හෝ වියදම් හෝ සමාගමේ ඈවරකරු විසින් සේවයට බඳවා ගන්නා ලද නීතිඥවරයකුගේ විශේෂ දීමනාවක් හෝ එකී ඈවරකරුගේ හෝ යම් කළමණාකරුවෙකුගේ, ගණකාධිකාරිවරයෙකුගේ, වෙන්දේසිකරුවකුගේ හෝ වෙනත් අයෙකුගේ යම් වේතන, අයකිරීම් හෝ වියදම් අධිකරණයේ ලේකම් විසින් තක්සේරු කර හෝ අවසර දී නොමැතිව සමාගමේ වත්කම් වලින් නොගෙවිය යුතු බවට අධිකරණය නියෝග කරන ලදී. තවද, ඒ අනුව එවැනි ගාස්තු, අයකිරීම්, වියදම් සහ වේතන තක්සේරු කිරීම සහ තහවුරු කිරීම කළ යුතු බවටද නියෝග කරන ලදී. තවද, පෙත්සම්කරුගේ වියදම් ද ඇතුළුව සමාගමේ ණයහිමියන්ට, සහදායකයන්ට සහ ඉහත කී ඈවරකරුට සහ උනන්දුවක් දක්වන වෙනත් සියලුම තැනැත්තන්ට අවස්ථාවෝචිත පරිදි සාමාන්‍යයෙන් අයදුම් කිරීමට නිදහස තිබිය යුතු බවට ද අධිකරණය නියෝග කරන ලදී.

අධ්‍යක්ෂ,
බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව.
ශ්‍රී ලංකා මහ බැංකුව,

අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01.

EOG 02 - 0221